කොටපොල ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කොටපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් කර්මාන්තයන්ට අදාළව ලැබිය යුතු රු.3,168,389 ක් කර්මාන්ත ණය ගැතියන් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.600,557ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.4,412,073 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අදාල තහවුරුව ලද පසු ප්‍රතිපාදන වෙන් කරමි. |
| (iv) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් දැන්වීම් පළ කිරීමට දරන ලද රු.130,984 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |

**(ආ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින රු.64,848 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හදුනාගෙන අදාළ ගැලපීම් කර නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | අවිනිශ්චිත ගිණුම හට ගැනීමට හේතු සොයා බලා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.731,652 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාලව අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(2) | නියැදි පරීක්ෂාවට අනුව රු.803,662 ක වටිනාකමින් යුක්ත අල්මාරි 08 ක් සහ වීථි පහන් ස්ථාපිත කිරීම සඳහා උපාංග මිලදී ගැනීමේදී රහස්‍යභාවය රැකෙන පරිදි මිල ගණන් ලබාගෙන නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී උපාංග මිලදී ගැනීමේදී රහස්‍යභාවය රැකෙන පරිදි මිල ගණන් ලබා ගන්නෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,999,509 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,570,380 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,751,000 | 4,214,115 | 3,941,104 | 1,222,092 | 6,192,000 | 3,133,963 | 3,059,826 | 949,081 |
| කුලී | 4,250,000 | 5,928,649 | 6,468,772 | 1,622,072 | 4,189,500 | 6,164,927 | 4,159,542 | 2,162,195 |
| බලපත්‍ර ගාස්තු | 1,112,000 | 1,710,722 | 1,710,722 | - | 1,003,000 | 913,956 | 913,956 | - |
| වෙනත් ආදායම් | 30,044,000 | 18,375,229 | 15,363,160 | 20,914,491 | 21,877,500 | 21,285,087 | 27,986,847 | 17,902,422 |
| එකතුව | 42,157,000 | 30,228,715 | 27,483,758 | 23,758,655 | 33,261,500 | 31,497,933 | 36,120,171 | 21,013,698 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු. 213,610 ක් වූ අතර රු.47,984 ක් වූ වර්ෂයේ බිල් කිරීම සමඟ රු.261,594 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු. 46,397 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 215,197 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අක්කර බදු ලේඛන වල ඉඩම් වල නම් සඳහන් නැති " අයිතිකරු " ලෙස පමණක් නම ඇති ඉඩම් සහ ඉඩම් වල අයිතිකරු මියගොස් කැබලි කර වෙන්දේසි කර ඇති ඉඩම් වලට අදාළ රු.43,965ක මුදල කපා හැරීමට 2020 පෙබරවාරි 18 දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනාව සම්මත වී ඇත. |

### 2.2.3 කුලී

**(අ) පොළ මාළු ලැලි බදු කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.1,888,974 ක් වූ අතර රු.4,167,481 ක් වූ වර්ෂයේ බිල් කිරීම සමඟ රු.6,056,455 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.4,528,658 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 1,527,797 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාළ බදුකරුවන්ට ලිපි මගින් දැනුවත් කර, කොටස් වශයෙන්ද අය කරන අතර ඉතිරි හිඟ මුදල් සඳහා නීතිමය පියවර ගනිමින් සිටිමි. |

**(ආ) ව්‍යාපාර බදු කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.141,637 ක් වූ අතර රු.1,960,635 ක් වූ වර්ෂයේ බිල් කිරීම සමඟ රු.2,102,272 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,607,145 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 495,127 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. |

**2.2.4** **ජල ගාස්තු**

**------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.2,193,641 ක් වූ අතර රු.3,099,248 ක් වූ වර්ෂයේ බිල් කිරීම සමඟ රු.5,292,889 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,294,299 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 1,998,590 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිග මුදලද අයකර ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා විභාග වෙමින් ඇත. |

**2.2.5** **වෙනත් ආදායම්**

**-----------------**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.2,668,691 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.16,247,209 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ගෙන්වා ගැනීම සඳහා මූලික අවධානය යොමු කර කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සකස් කරමින් සිටින අතර එම සැලසුම් මහා සභාවේ අනුමැතියටද ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කර ගැනීමට හා 03 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර ඇත. පුරප්පාඩු 03 ක් සහ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට ගැසට් පත්‍රයේ දැන්වීම් පළකොට අයදුම්පත්‍ර කැඳවා ඇති අතර අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම්දීමක් අනුව මේ වන විට සියලු බඳවාගැනීම් නවතා ඇත. |
| (ආ) **සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 10 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.34,371 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකරගත යුතුවේ. | අවශ්‍ය කටයුතු කරමින් හා නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් කඩිනමින් මෙම මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමි. |

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන 27 ක් පැවති අතර මෙම ආයතන මඟින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. තවද පෙරසැරි ගාස්තු හා පරිසර බලපත්‍ර ගාස්තු වශයෙන් රු.189,000 ක් සභාවට අයවී නොතිබුණි. | සුදුසුකම් පරීක්ෂා කර පරිසර බලපත්‍ර ලබාදීම හෝ ලබා නොගන්නා ව්‍යාපාර සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුවේ. | අඩුපාඩු සම්පූර්ණ කල වහාම එම කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාදෙන බවත් ඉතිරි කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුවත් කර ලිපි යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ආදායමින් සියයට 01 ක් නො ඉක්ම වූ ගාස්තුවක් අයකළ යුතු වුවත් සභා බල ප්‍රදේශයේ පිහිටි හෝටල් 03 කින් සමාලෝචිත වර්ෂය සඳහා ගාස්තු අයකර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හෝටල් 03 න් දෙනියාය තානායම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අනෙත් හෝටල් 02 සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු දෙනියාය හා කොටපොළ පුස්තකාල දෙකෙන් අස්ථානගත වූ පොත් සංඛ්‍යාව 211 ක් වූ අතර වටිනාකම රු. 51,560 ක් විය. | අස්ථානගතවූ පොත්වල වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වේ. | දෙනියාය හා කොටපොල පුස්තකාල දෙකෙහි අස්ථාන ගතවූ පොත් 211 න් ඉදිරි භාණ්ඩ සමීක්ෂණයේදීද අස්ථාන ගතවූ ලෙස සඳහන්වේ නම් එම මුදල අදාළ නිළධාරීන්ගෙන් අයකරමි. |